BD/PGH/CPHMA/1/2013

අභ්‍යන්තර චක්‍රලේඛ අංක: - 01/2022

අධ්‍යක්ෂ,
පළාත් මහ රෝහල,
බදුල්ල.

2022.02. 23

සියලුම රෝහල් කාර්ය මණ්ඩලය වෙත,

<u>රසායනාගාර සාම්පල් භාර දීම සහ වාර්තා ලබා ගැනීමේ නව ක්‍රමවේදය සම්බන්ධව 2019.12.09 දිනැති 06/2019 අභ්‍යන්තර චක්‍රලේඛය සඳහා සංශෝධනය</u>

2022.01.12 දින රසායනාගාරයේ විශේෂඥ වෛද්‍ය නිලධාරීන් හා රසායනාගාර කාර්යය මණ්ඩලය සමග පැවති රැස්වීමේදී රසායනාගාරය මගින් රෝහල් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ රුධිර සාම්පල් පරීක්ෂා කර ගැනීමේ ක්‍රමවේදයේ පවතින ගැටළු සාකච්ඡා කර එහිදී ගන්නා ලද තීරණ වලට අනුව වඩා කාර්යක්ෂම සහ ඵලදායි රසායනාගාර සේවාවක් සැපයීම සඳහා 2019.12.09 දිනැති 06/2019 අභ්‍යන්තර චක්‍රලේඛය සඳහා පහත සඳහන් පරිදි සංශෝධන ඉදිරිපත් කරනු ලැබේ. මෙම නව ක්‍රමවේදය <u>2022.03.01</u> දින සිට ක්‍රියාත්මක කළ යුතු බව දන්වා සිටිමි.

ඒ අනුව, වගවීම හා වගකීම තහවුරු කෙරෙන විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමේ අරමුණින් රසායනාගාර සාම්පල් භාර ගැනීමේදී හා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමේදී පහත සඳහන් නව පියවරයන් අනුගමනය කළ යුතුය.

- පරීක්ෂණ ඉල්ලුම් කිරීමේ ආකෘතියේ (Request form) වෛද්‍යවරයාගේ නම, අත්සන හා නිල මුද්‍රාව (Consultant unit frank) සඳහන් කිරීම අනිවාර්ය වේ.
- රසායනාගාරය වෙත පරීක්ෂණ සාම්පල් භාර දීමේදී, විවිධ ශ්‍රේණි සඳහා වෙන් වෙන් වශයෙන් පවත්වා ගෙන යනු ලබන ලියාපදිංචි ලේඛන ඉවත් කර සියළුම ශ්‍රේණි සඳහා එක් ලියාපදිංචි ලේඛනයක් (Test registry) පවත්වා ගෙන යාමට කටයුතු කරනු ලැබේ. (<u>2022.03.01</u> සිට)
- එම සාම්පල රසායනාගාරය වෙත භාර දීමේදී, ලියාපදිංචි කිරීමේ ලේඛනයේ (Test registry) දිනය, පරීක්ෂණය, සාම්පලය භාර දෙන නිලධාරියාගේ නම හා වැටුප් අංකය අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.
- කාර්ය මණ්ඩලයේ රසායනාගාර සාම්පල (staff sample) පරීක්ෂණ වාර්තා අනිවාර්යයෙන් රැගෙන යා යුතු අතර, එසේ එකතු කර නොගත් පරීක්ෂණ වාර්තා පිලිබඳව රසායනාගාරය මගින් (අදාල නිලධාරීන්ගේ නම් හා වැටුප් අංකය සහිතව) ලැයිස්තුවක් සකස් කර අධ්‍යක්ෂතුමා වෙත භාර දීමට කටයුතු කරනු ලැබේ.
- සායන හා ඒකක වල රෝගීන්ගේ එකතු කර නොගත් පරීක්ෂණ වාර්තා අදාල සායනය වෙත භාර දීමට කටයුතු කරන අතර, සායනය මගින් රෝගීන් වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ඉහත ක්‍රමවේදය මගින් කාර්ය මණ්ඩලයට අවශ්‍ය පහසුකම් සැලසීම නිසි ක්‍රමවේදයක් අනුව ඉටුවීම බලාපොරොත්තු වන අතර ඒ සඳහා සියළුම කාර්යය මණ්ඩලයේ සහයෝගය ලබා දීමට කාරුණික වන ලෙස දන්වා සිටිමි.

Dr. Upul Karunarathne
MBBS.MSc (Med.Admin). MD(Med.Admin)
Director
Provincial General Hospital
Badulla.

..........................
අධ්‍යක්ෂ.
පළාත් මහ රෝහල, බදුල්ල.

පිටපත-

- ප්‍රධාන රසායනාගාර කාර්මික විද්‍යාඥ - ඉහත ක්‍රමවේදය අනුව ලියාපදිංචි කිරීමේ පොත් සහ අවශ්‍ය ලිපි ගොනු පවත්වා ගෙන යාම සඳහා